**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා

ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 99 ඡේදය හා 48 ඡේදයට අනුකූල නොවන පරිදි විශ්වවිද්‍යාලයේ විවිධ කාර්යයන් වෙනුවෙන් ආරම්භ කර | පර්යේෂණ අරමුදල් 84 ක් සහ වෙනත් අරමුදල් 154 කට අදාළ ආදායම්, ලැබීම් හා ගෙවීම් 2019 වර්ෂයේ සිට මූල්‍ය කාර්යසාධන | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව කටයුතු |

| | | | |
|---|---|---|---|
| | තිබූ අරමුදල් 257 ක රු.853,275,503 ක් වූ මුළු ආදායමින් රු.833,317,158 ක වියදම හිලව් කර ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. අනෙකුත් අරමුදල් ගිණුම් 19 කට අදාළව අරමුදල් සම්පාදනය බාහිර ආයතනයන් මගින් සිදු කර ඇති අතර මේවා විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙස සැලකිය නොහැකිය. | කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 47 ඡේදයට අනුකූල නොවී විශ්වවිද්‍යාලය වෙත ඉකුත් වර්ෂයන්හි පරිත්‍යාග ලෙස ලබා දී තිබූ රු.4,688,998,047 වූ වත්කම් වර්ෂයකට සියයට 10 බැගින් ක්‍රමක්ෂය කිරීම සඳහා නව ප්‍රතිපත්තියක් ස්ථාපනය කර ඇතත්, අතීතානුයෝගීව නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන අවසන් ගිණුම්වල 2018 වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීම මගින් අතීතානුයෝගීව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව, කටයුතු නොකිරීම හේතුවෙන් රු.692,530,391 ක් වූ ජංගම නොවන වත්කම් (පුස්තකාල පොත් හා ප්‍රකාශන) සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තව දුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පුස්තකාලවල ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරමින් පවතින අතර ඒ අනුව අදාළ ප්‍රත්‍යාගණන කාර්යය අවසන් වූ වහාම එම වටිනාකම් ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.12,499,290 ක ක්‍රමක්ෂය වටිනාකම පොදු සංචිතයට ගැලපීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන අවසන් ගිණුම්වල 2018 වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීම මගින් අතීතානුයෝගීව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ලද ප්‍රතිපාදන මුදල ඉක්මවා වියදම් කිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් (Unspent Capital Grant) 14 ක රු.395,314,856 ක හර ශේෂ දක්වා තිබුණි. | මෙය අභ්‍යන්තර මුදල් මාරු කිරීමක් වන අතර ඒ සඳහා 374 වන මුදල් කමිටු සහ පාලක සභා අනුමැතිය ලබා ගෙන ඇත. කෙසේ නමුදු මෙම ගෙවීම් ව්‍යාපෘතියට වෙන් කර ඇති වටිනාකම ඉක්මවා සිදු කර නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු අතර අයවැයගත සීමාවන් තුළ කටයුතු කළ යුතුය. |
| (ඇ) | පෙර වර්ෂයට අදාළ පාරිතෝෂික ඌන වෙන් කිරීම රු.84,103,157 ක් වුවත්, එය රු.83,585,810 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.517,347 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන ඡේදයේ දක්වා ඇති රු.517,347 නිර්මාණය වී ඇත්තේ පෙර වර්ෂය (2017) පාරිතෝෂිත ගෙවීම් සඳහා බැවින් එම මුදල ජංගම වගකීම් යටතේ පෙන්නුම් කර ඇත. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේ ඌනතාවයට කිසිදු බලපෑමක් නොමැත. | වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගැළපීම් කළ යුතුය. |
| (ඈ) | පීය 05 ක විවිධ තොග අයිතම 11 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2018 වර්ෂයේ තොග සමීක්ෂණයේදී හඳුනාගත්තා ලද මෙකී අයිතම 11, 2019 වර්ෂයේදී තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලුම අයිතම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දිවි නැඟුම දෙපාර්තමේන්තුව වෙත බදු පදනම මත ලබා දී ඇති බිම් කැබලි 04 ක් මඟින් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ රු.6,590,000 ක මුදලක් සහ 2017 හා 2018 වර්ෂයන්ට අදාළ බදු මුදල් සහ දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | දිවිනැගුම දෙපාර්තමේන්තුවේ බදු ගිවිසුම් කාලය 2017 වර්ෂයෙන් අවසන් වී ඇත. ඒ අනුව 2018 වර්ෂයට බදු මුදල් හෝ දඩ මුදල් ගණනය කිරීමට හැකියාවක් නොමැත. මේ වන විට එම ගොඩනැගිලි පරිශ්‍රයෙන් භාගයක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන ඇත. ඉතිරි ගොඩනැගිලි ප්‍රමාණයද පවරා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී. | විශ්වවිද්‍යාලයට නිත්‍යානුකූලව ලැබිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීම හෝ ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | විශ්වවිද්‍යාලය විසින් පීය 03 ක් පවත්වාගෙන යන අක්කර 73 හා පර්චස් 53.4 ක් වන ඉඩම් විධිමත් පරිදි විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන, වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | දැනට විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට නියමිතව ඇත්තේ වෛද්‍ය පීඨයේ ඉඩම (අක්කර 17), මහඉලුප්පල්ලම ඉඩම (අක්කර 35) යන ඉඩම් පමණි. එම ඉඩම් පවරාගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. එබැවින් විශ්වවිද්‍යාලය වෙත නීතිමය අයිතිය තහවුරු කළ නොහැකි ඉඩම් ස්ථාවර වත්කම් | විශ්වවිද්‍යාලය කටයුතු පවත්වාගෙන යන සහ විශ්වවිද්‍යාලය මඟින් සංවර්ධනය කරනු ලබන මෙම ඉඩම් කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය නොහැකි බැවින් ගිණුම්ගත කර නොමැත.

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ගෙවිය යුතු ගිණුම් ශේෂ | | | | විශ්වවිද්‍යාලය විසින් ණයහිමියන් ලෙස සලකනු ලබන්නේ භාණ්ඩ හෝ සේවා විශ්වවිද්‍යාලය මත ලබා දීමෙන් පසු එකී භාණ්ඩ Good Acceptance Committee යෙන් අනුමත වූ පසුවය. | අදාළ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර ගිණුම් වර්ෂය අවසානයට ඊට අදාළ සැසඳුම් ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| DMS Electronic (Pvt) Ltd | 7,748,627 | 21,147,816 | 13,399,189 | | |
| Advance Micro Technology (Pvt) Ltd | 1,325,199 | 1,125,299 | 199,900 | | |
| Dinapala (Pvt) Ltd | 294,906 | 8,900 | 286,006 | | |
| Mahanuwara Agencis | 32,500 | 7,088 | 25,412 | | |
| IMS Holdings | 1,196,500 | 1,318,500 | 122,000 | | |
| Hemsons International (Pvt) Ltd | 109,500 | 3,189,384 | 3,079,884 | | |

**1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තර | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ PED/12 චක්‍රලේඛය මඟින් දක්වා ඇති “යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසායයන්ට මඟපෙන්වීම” නම් අත්පොතෙහි 8.2.2 සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තියට අනුකූල නොවන පරිදි විශ්වවිද්‍යාලය මඟින් සමාලෝචිත වර්ෂයේ රු.263,740,682 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | අතිරික්ත මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව ආයෝජනය කොට එකී ආයෝජනයන් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. | පවත්නා නීති, රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 101 (ඇ) වගන්තිය අනුව කටයුතු නොකර, මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 1026 ක් වූ වෛද්‍ය පීඨයේ පශ්චාත් වෛද්‍ය විද්‍යා පාසල ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා 2014 සහ 2015 වර්ෂයන්හිදී ලබාදී තිබූ රු.මිලියන 330 ක ප්‍රතිපාදිත මුදලින් රු. මිලියන 285 ක මුදලක් අනුමැතියක් නොමැතිව පුනරුත්තාපන වැඩ කටයුතු සඳහා මාරු කර තිබුණි. | විගණනය පෙන්වා දී ඇති රු. මිලියන 285 ක මුදල, මුදල් කමිටුවේ හා පාලක සභාවේ අනුමැතියට යටත්ව 2016 දෙසැම්බර් මස පුනරුත්ථාපන වැඩ සඳහා මාරු කොට ඇති බව කාරුණිකව දන්වමි. තවද ඉදිරියේදී මෙකී ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන අවස්ථාවේදී මෙම මුදල නැවත මාරු කිරීමේ අදහසින් මෙම කටයුත්ත සිදු කර ඇත. | පවත්නා නීති, රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | උසස් අධ්‍යාපන කටයුතු සඳහා භාණ්ඩාගාරය මඟින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ වෙන් කරන ලද රු.238,417,183 ක් වටිනා ප්‍රතිපාදන සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් මහනුවර, කුරුණෑගල සහ පේරාදෙණිය යන රෝහල්වල සංවර්ධන කටයුතු සඳහා විශ්වවිද්‍යාලයේ අරමුණට පටහැනිව හා විධිමත් අනුමැතියකින් තොරව යොදාගෙන තිබුණි. | අදාළ අමාත්‍යාංශ සමග සාකච්ඡා කොට අවශ්‍ය ගැළපීම් කරමි. | වාර්ෂික විසර්ජන පනතට අනුගත විය යුතුය. |

## 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ජංගම ගිණුම් 07 ට අදාළ ගනුදෙනු | 18,196,804 | මුදල් පොත්, බැංකු සැසඳුම්, බැංකු ප්‍රකාශන ශේෂ සනාථ කිරීම් | මුදල් පොත්, බැංකු සැසඳුම්, බැංකු ප්‍රකාශන ශේෂ සනාථ කිරීම් මේ සමග අමුණා ඇත. | මූල්‍ය ප්‍රකාශන විගණනයේදී කඩිනමින් අදාළ ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දේපළ කුලි ආදායම් | 12,062,824 | ගිවිසුම්, කුලි දේපළ විස්තර ඇතුළත් ලේඛන | මේ වන විට අවශ්‍ය සියලුම ගිවිසුම් හා ලේඛන සාමාන්‍ය පාලන අංශයේ ගොනුකර ඇත. විගණනය සඳහා අවශ්‍ය | අදාළ ගිවිසුම් යාවත්කාලීන කර ආදායම් නිවැරදිව අයකර, ලේඛන තහවුරු කර ගැනීම සඳහා |

| | | | |
|---|---|---|---|
| | | අවස්ථාවේදී ලබා දීමට හැකියාව ඇති බව දන්වා සිටිමි. | විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවිධ පුද්ගලයන් හා ආයතන 44 කින් ලැබිය යුතු රු.1,517,369 ක් වසර 01 සිට වසර 14 ක කාලයක් ගත වී ඇතත් අයකර ගෙන නොතිබුණි. | මේ වන විට එම අදාළ පාර්ශවයන්ගෙන් රු.69,910 ක ජල ගාස්තු අය වී ඇත. 2007 වසරේ සිට ඉදිරියට ගෙන ආ රු.400,000 ක ශේෂය ලැබිය යුතු රක්ෂණ වන්දියක් ලෙස සඳහන් වේ. අදාළ මුදල් රක්ෂණ සමාගමෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. | ලැබිය යුතු ශේෂ නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වාර්ෂිකව විගණන වාර්තාවලින් නිරීක්ෂණයට ලක් කරන ලද විශ්වවිද්‍යාලයේ පීඨ 09 ක සිසුන්ගෙන් අයවිය යුතු ශාලා ගාස්තු රු.1,735,950 ක් හා රු.5,320,542 ක් වූ දඩ මුදල් වසර 01 සිට 37 ක් දක්වා කාලයක් ගත වී ඇතත්, අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාලය තුළ තවමත් ඉගෙනීමේ කටයුතුවල නිරත සිසුන්ගෙන් අයවිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල්, ඔවුන් විසින් උපාධි පාඨමාලාව සම්පූර්ණ කර අදාළ සහතිකපත් ලබා ගැනීමේදී අය කර ගැනීම පවතින ක්‍රමවේදය යටතේ සිදු කරනු ලබයි. පෙර වර්ෂවලට අදාළ ලැබිය යුතු ගාස්තු හා දඩ මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් පත් කරන ලද ත්‍රිපුද්ගල කමිටුවේ උපදෙස් මත අදාළ පීඨවලින් යොමු කරන ලද තොරතුරු තහවුරු කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර එහි නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ලැබිය යුතු ශේෂ නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විදේශීය ශිෂ්‍යා අරමුදලින් මිලදී ගැනීම් සඳහා 2017 වර්ෂයේදී වෛද්‍ය පීඨයේ චක්‍රීය අරමුදල (Medical Faculty Revolving Fund) වෙත මාරු කරන ලද රු.15,439,993 ක මුදලක් අය කර ගැනීමට කටයුතු නොකර, ලැබිය යුතු ශේෂයක් ලෙස ඉදිරියට ගෙන යමින් පැවතුණි. | ඉදිරියේදී විදේශීය ශිෂ්‍යා ආදායමින් එම මුදල් පියවා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂ නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාලය නිලධාරීන් වෙත වර්ග 05 ක් යටතේ නිකුත් කර ඇති ණය අතුරින් 2018 දෙසැම්බර් 31 දින රු.1,221,437 ක ණය මුදලක් ස්ථාන මාරු වීම් මත සහ වැටුප් නතර කිරීම මත අයවීම් නතර වී තිබුණි. | 2019 ජනවාරි/පෙබරවාරි මස සිට එම ණය වාරික අය කර ගැනීම ආරම්භ කොට ඇති අතර අය කර ගැනීමට නොහැකි වූ ණය වාරික මුදල් ඉදිරියේදී ඔවුන් විසින් ගෙවිය යුතු ණය වාරික ප්‍රමාණය මත සමානුපාතිකව අය කර ගැනීමට විශ්වවිද්‍යාලය දැනටමත් තීරණය කර ඇත. නිලධාරියා මිය යාම, වැඩ තහනම් කිරීම හා ඉල්ලා අස්වීම යන හේතූන් මත වැටුප් නතර වීම නිසා අය කර ගැනීමට නොහැකි වූ රු.251,830 ක මුදලක් සම්බන්ධයෙන් මේ වන විටත් කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ශේෂ නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වී ඇති අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් විශ්වවිද්‍යාලය සමග එළඹී ගිවිසුම උල්ලංඝනය කිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 110 දෙනෙකුගෙන්, රු.142,596,921 ක් අයවිය යුතුව තිබුණි. මේ තුළ ආචාර්යවරුන් 92 ගෙන් අයවිය යුතු රු.121,078,386 ක ප්‍රමාණයක් අයවීමේ සම්භාවිතාවය අවම මට්ටමක පැවතුණි. | ආචාර්යවරුන් 110 දෙනාගෙන් ආචාර්යවරුන් 73 ක් ඉතා පැරණි ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් වන අතර ඔවුන් සම්බන්ධයෙන් පාලක සභා අනු කමිටුවේ නිර්දේශය මත ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ. බැඳුම්කර වටිනාකම් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට ප්‍රමාණවත් වන ආචාර්යවරු 18 දෙනාගෙන් සහ අනෙකුත් ආචාර්යවරුන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටියි. | අදාළ ආචාර්යවරුන් සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කර රජයට ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 396 | චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි රු.2,307,389 ක් වටිනා චෙක්පත් 79 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායමට ගෙන තිබුණි. | මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව අවලංගු කිරීමට කටයුතු කර ඇති අතර මූල්‍ය රෙගුලාසි 396 සඳහන් පරිදි ඉදිරියේදී නැවත ගෙවීමට සිදුවුවහොත් නැවත ගෙවීමට හැකිවන පරිදි වෙනමම රෙජිස්ටරයක සටහන් තබා ඇත. | අදාළ නිතීමය විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 1646 | කෘෂිකර්ම පීඨයේ වාහන 05 ක ධාවන සටහන් මුදල් රෙගුලාසි ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම තොරතුරු නිසි වේලාවට ලබා දීමට ගොවිපල කළමනාකරු විසින් එකඟ වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PED/12 සහ 2003 ජූනි 02 දිනැති චක්‍රලේඛයේ 9.10 වගන්තිය | විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින විශේෂඥ ගණයට අයත් නොවන පුරප්පාඩු 296 ක් පිරවීමට හෝ අහෝසි කර දැමීමට 2019 මාර්තු මස වන විටත් කටයුතු නොකර පුරප්පාඩු වශයෙන් දිගින් දිගටම පවතින බව නිරීක්ෂණය වේ. | දරන්නාට පමණක් පුද්ගලික වශයෙන් තනතුරු පැවතීම, බඳවා ගැනීමේ පරිපාටි නොමැති වීම හා වැටුප් කේතවල නොගැලපීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හා අමාත්‍යාංශය විසින් පිරවිය යුතු තනතුරු පැවතීම යන හේතු නිසා අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලයේ දෛනිකව වෙනස් වේ. නමුත් බඳවා ගැනීම්වලට අදාළ අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අදාළ පුරප්පාඩු කඩිනමින් පිරවීමට හෝ අහෝසි කර දැමීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර | ඉංජිනේරු හා වෛද්‍ය පීඨය තුළ ආචාර්යවරුන් 12 දෙනෙකුගේ දූ දරුවන් එම පීඨවල අධ්‍යයන කටයුතුවල | දැනට අනාවරණය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් නොමැති අතර ඉදිරියේදී ක්‍රමවේදයක් සකස් | අදාළ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශයේ 5 වන වගන්තිය | නිරත වන බව නිරීක්ෂණය විය. නමුත් එම තත්ත්වය අනාවරණය කර ගැනීම හෝ මේ මඟින් තත්ත්ව පාලනයට ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් වළක්වා ගැනීම සම්බන්ධයෙන් කිසිදු වැඩ පිළිවෙලක් මෙම පීඨ දෙක මඟින් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | කිරීමට කටයුතු කරමින් සිටියි. | |
| (ඉ) | 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවන කොටස | විශ්වවිද්‍යාලයේ විද්‍යාගාරවල භාවිතා කර ඉවත් කරනු ලබන රසායනික ද්‍රව්‍ය හා දිරාපත් නොවන පොලිතින් වැනි ද්‍රව්‍ය විශ්වවිද්‍යාල භූමියේ සකස් කරන ලද වළකට බැහැර කර තිබුණු අතර, විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර 03 ක මළ අපවහන පද්ධතීන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් අවිධිමත් ලෙස පරිසරයට මුදා හැර තිබුණි. | රසායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා Insee Ecocyle ආයතනය සමග ගිවිසුම්ගත වී ඇති අතර මළ අපවහන පද්ධතියත් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | අපද්‍රව්‍ය බැහැර කිරීම හා විමෝචනය සම්බන්ධයෙන් පවතින නීති, රීති පිළිබඳ දැඩි අවධානයෙන් සිටිය යුතු අතර ඒ අනුව ක්‍රියාත්මක විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.665,251,029 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.668,666,112 ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,415,083 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට පුනරාවර්තන රාජ්‍ය ප්‍රදාන වැඩිවීම, පැරණි වත්කම් විකුණුම් ආදායම් වැඩිවීම, විදේශ ශිෂ්‍ය ආදායම් වැඩිවීම හා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අනුබද්ධිත ක්‍රියාකාරකම් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේ පමණක් අතිරික්තයක් ඇති වී තිබූ අතර, අනෙකුත් සෑම වර්ෂයකම ඌනතාවයක් ඇති වී තිබුණි. එමෙන්ම සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකීමේ දී 2014 වර්ෂයේ

රු.3,254,372,377 ක් වූ ආයතනයේ දායකය 2017 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී එය රු.5,117,805,369 ක් වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවනතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය සමග සසඳන විට සමාලෝචිත වර්ෂයේ ඌනතාවයට සැලකිය යුතු බලපෑමක් සිදු වී නොතිබුණද, පුනරාවර්තන වැඩ සඳහා වූ රාජ්‍ය ප්‍රදාන, විදේශ ශිෂ්‍ය ප්‍රදාන, පැරණි වත්කම් විකුණුම් මගින් ඉපැයූ ආදායම හා අනුබද්ධ ක්‍රියාකාරකම් මගින් ඉපැයූ ආදායම් සියයට 23 සිට සියයට 633 දක්වා පරාසයකින් වැඩි වී තිබූ අතර විශ්වවිද්‍යාලය ජාත්‍යාන්තර මට්ටමට සංවර්ධනය සඳහා ලද ප්‍රදාන, මානව සම්පත් සංවර්ධනය සඳහා ලද ප්‍රදාන, ලියාපදිංචි ගාස්තු ආදායම්, විභාග ගාස්තු හා පශු සම්පත් මගින් ලැබෙන පාඩුව සියයට 38 සිට සියයට 260 දක්වා පරාසයකින් අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ 1:2.2 ක් ලෙස පැවති ජංගම වත්කම් අනුපාතය සමාලෝචිත වර්ෂයේ 1:1.8 ක් ලෙස පහත වැටී තිබූ අතර ක්ෂණික වත්කම් අනුපාතය 1:1.4 ක් වී තිබුණි. ඒ අනුව මෙම අනුපාතයන් ක්‍රමයෙන් පහත වැටීම විශ්වවිද්‍යාලයේ ජංගම වගකීම් පියවීමේ අවදානමක් ඇතිවීම හෝ ජංගම වගකීම් පියවීමට දීර්ඝ කාලයක් ගත වීමට හේතු විය හැකි බව නිරීක්ෂණය විය.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 මාර්තු 26 දිනැති අංක 06/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව, සියලුම අංශ ප්‍රධානීන් වෙනුවෙන් මූලික වැටුපෙන් සියයට 8 ක මුදලක් සංග්‍රහ දීමනා වශයෙන් ගෙවන නමුත් ඊට අනුකූල නොවන ලෙස සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී වෙත රු.27,490 ක මුදලක් 2018 වර්ෂය තුළ අවස්ථා 06 කදී ගෙවීම් කර තිබුණි. | මාසික රැස්වීම් සඳහා සහභාගීවූවන්ට සංග්‍රහ කිරීම වෙනුවෙන් මෙම මුදල් ප්‍රතිපූර්ණය කර ඇත. ඉදිරියේදී විමසුමෙහි සඳහන් කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ අංශ ප්‍රධානි දැනුවත් කර ඇති බව දන්වා සිටිමි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ XIII වන පරිච්ඡේදයේ 101 (ආ) උප වගන්තියට අනුකූල නොවන පරිදි ශාරීරික අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 04 කදී බාහිර පාර්ශවයන් විසින් ගෙවන ලද රු. 22,500 ක මුදලක් ආයතන අරමුදලට බැර නොකර, අවිධිමත් ලෙස සේවකයන් විසින් ලබා ගෙන තිබුණි. | එම අවස්ථාවේ ක්‍රීඩා පිටියේ සේවය කළ සේවකයින් නව (09) දෙනෙකුගෙන් එක් අයකු සඳහා රු.2,500 බැගින් (වාරික දෙකකින්) ආයතනයට වැටුපෙන් අය කර ගැනීමට කටයුතු යොදන බව මෙයින් දැනුම් දෙමි. | අදාළ නීතිමය විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) වෛද්‍ය පීඨයේ පශ්චාත් වෛද්‍ය විද්‍යා පාසල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2014 සහ 2015 වර්ෂයන්හිදී රු. මිලියන 330 ක මුදලක් ප්‍රතිපාදන සලසා ගෙන ඉන් රු.39,703,080 ක් උපදේශන සේවා සමාගමකට ගෙවීම් කර තිබුණු නමුත් මේ දක්වා ඉදිකිරීම් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතියට ඇතුළත් කාර්යයන් පිළිබඳ තීරණය කිරීම විවිධ අවස්ථාවලදී වෙනස් වූ අතර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව හා අමාත්‍ය මණ්ඩල නිර්දේශ අනුව අවස්ථා කීපයකදී ව්‍යාපෘතියට අදාළ යම් යම් වෙනස්කම් සිදු කළ අතර අවසාන වශයෙන් 2014 දෙසැම්බර් මස 24 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එවකට සිටි මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමාගේ නිරීක්ෂණවලට අවධානය යොමු කරමින් නැවත සකස් කරන ලද ව්‍යාපෘති ඇස්තමේන්තු සටහන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කර ඇත. | නිසි ඇගයීමකින් පසු ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර වාර්ෂික විසර්ජන පනතට අනුගත විය යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික හා සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.7 වගන්තියට අනුකූල නොවීම හේතුවෙන් විශ්වවිද්‍යාලය වෙත සමාලෝචිත වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය වාරික අයකර ගැනීමට නොහැකිවී තිබූ අතර, රු.1,841,805 ක් වූ ණය වාරික හා ඊට අදාළ පොලී මුදල් මාස 01 සිට මාස 14 දක්වා කාලයක් අය නොවී පැවතුණි. | 2018 වර්ෂයේදී ප්‍රමාණවත් පුනරාවර්ථන වැය සඳහා මහා භාණ්ඩාගාරයෙන මුදල් නොලැබුණු නිසා ණය පවරා ගැනීම ප්‍රමාද විය. එබැවින් ණය පවරා ගන්නා තුරු ණය වාරික අය කිරීමට නොහැකි වූ බැවින් මෙම තත්ත්වය නිර්මාණය වී ඇති අතර 2018 දෙසැම්බර් 31 දිනට මෙම සියළුම ණය පවරාගෙන 2019 ජනවාරි /පෙබරවාරි මස සිට ණය වාරික අය කර ගැනීම ආරම්භ කොට ඇති අතර මේ වන විට ණය පවරා ගැනීම ක්‍රමවත්ව කර ගෙන යන බවද වැඩිදුරටත් දන්වා සිටිමි. | අඛණ්ඩව ණය වාරික අය කර ගැනීමට විධිමත් ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1976 මාර්තු 09 දිනැති අංක 61 හා 1976 දෙසැම්බර් 07 දිනැති අංක 70 දරන එකී වර්ෂයට පමණක් අදාළව නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛ මත පදනම්ව විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය දක්වා සේවක ණය, ආපදා ණය, මෝටර් බයිසිකල් ණය, වාහන ණය සහ පරිගණක ණය සඳහා අප්‍රේල් හා දෙසැම්බර් මාසවලට අදාළ ණය වාරික අය කර නොතිබුණි. | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලීය මුදල් චක්‍රලේඛ අංක 70 ට අනුව අප්‍රේල් හා දෙසැම්බර් මාසවලදී සේවක ණය, ආපදා ණය, මෝටර් බයිසිකල් ණය, වාහන ණය, පරිගණක ණය මත මුදල් වෙනුවෙන් වාරික අය කර ගැනීම අත්හිටුවන අතර පොලිය පමණක් අය කරනු ලබයි. කෙසේ වෙතත් අදාළ මාස සඳහා පොලි මුදල් අය කරන බැවින් විශ්වවිද්‍යාලයට මූල්‍යමය පාඩුවක් සිදු නොවේ. | ණය වාරික අඛණ්ඩව අය කළ යුතුය. |
| (ඇ) | ශිෂ්‍ය ප්‍රායෝගික පුහුණුව සහ වාහන අළුත්වැඩියාව සඳහා ඉංජිනේරු පීඨයේ ස්ථාපිත කර තිබූ වාහන නඩත්තු ඒකකය 2017 වර්ෂයේදී එහි කටයුතු නවතා එය නැවත ස්ථාපිත නොකිරීම හේතුවෙන් සිසුන්ගේ ප්‍රායෝගික පුහුණු වීම් සහ වාහන නඩත්තු කටයුතු සඳහා බාධාවක් වී තිබුණි. | වාහන අලුත්වැඩියා කිරීමේ ඒකකයක් නැවත ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘති වාර්තාව අනුමැතිය සඳහා පාලක සභාව වෙත යොමු කර ඇත. | ශිෂ්‍යයන්ගේ ප්‍රායෝගික පුහුණු අවශ්‍යතාවයන් සහ විශ්වවිද්‍යාලයට අයත් වාහන ප්‍රමාණය මත මෙන්ම අදාළ උපකරණ සහ පුහුණු සේවකයින් ඌන සේවා නියුක්තිය හේතුවෙන් මෙම ඒකකය කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 (2) (ඇ) උප වගන්තිය, 18 (2) (1) සහ (3) වගන්ති සහ 29 වගන්තියට අනුකූල නොවන පරිදි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය 2016/2017 අධ්‍යයන වර්ෂය දක්වා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයින් 1064 ක් ලියාපදිංචි කර පශ්චාත් උපාධි පාඨමාලා 04 ක් පවත්වාගෙන ගොස් තිබුණි. | ඉංජිනේරු පීඨය මඟින් ප්‍රදානය කරනු ලබන ඇතැම් පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ඇති නමුත් බොහොමයක් පාඨමාලා සඳහා අනුමැතිය ලබා ගෙන නොමැත. මේ වන විටත් පශ්චාත් උපාධි පාඨමාලාවන්ට අදාළ නීති රෙගුලාසිවල සංශෝධනයන් සිදු කෙරෙමින් පවතින අතර SLQF මාර්ගෝපදේශයන්ට අනුගත වීමද සිදුවෙමින් පවති. සියළු සංශෝධනවලින් අනතුරුව | පවතින නීති, රීතිවලට අනුගත විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අවශ්‍ය පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර ඇති ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි අධ්‍යයන පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන අත්පොතෙහි 7 වන නිර්නායකය අනුව විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨවල ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රමවේදයක් සහ ප්‍රමිතියක් සකස් කර විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලයේ පීඨ 05 ක කටයුතු කර තිබුණි. | නිශ්චිත ප්‍රමිතිගත ක්‍රමවේදයක් (Standered Operating Procedures) අනුමැතිය ලබා ගැනීම සඳහා සකස් කරමින් පවතී. | විභාග ක්‍රමය තුළ විනිවිදභාවය ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රමවේදයන් භාවිතය සඳහා විශේෂ අවධානය යොමු කර කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන තත්ත්ව ආරක්ෂක සභාවේ මාර්ගෝපදේශය අනුව දේශන පැවැත්වීමේ කාල සටහන් පිළියෙල කිරීමට ඉංජිනේරු සහ වෛද්‍ය පීඨ 02 ක කටයුතු කර නොතිබූ අතර අදාළ මහපෙන්වීම්වලට අනුගත වීම සඳහා වෙනත් ක්‍රමවේදයක්ද හඳුන්වාදී නොතිබුණි. | ඉංජිනේරු පීඨය වැඩ ගණනය කිරීමේ ක්‍රමවේදයක් (Work Calculator) සැකසීම සඳහා කමිටුවක් නම් කරන ලදි. වෛද්‍ය පීඨයේ ඉගෙනීමේ කටයුතු අංශ 03 ක් යටතේ පවත්වනු ලබයි. එය දේශන ලෙස, සායනික පුහුණුව (Clinical Training ) ලෙස සහ ප්‍රායෝගික පුහුණුව (Practical Training) ලෙස පවත්වාගෙන යයි. | අදාළ මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව ගුණාත්මක සේවාවක් ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඈ) | 2009/2010 අධ්‍යයන වර්ෂයේ සිට 2012/2013 අධ්‍යයන වර්ෂය දක්වා අධ්‍යයන වර්ෂ 4 වෙනුවෙන් කෘෂිකර්ම පීඨය සඳහා සිසුන් 224 ක් ලියාපදිංචි වී නොතිබූ අතර, එය ලියාපදිංචි කළ හැකි සිසුන්ගෙන් සියයට 20 ක ප්‍රතිශතයක් විය. | පාඨමාලාවන් සඳහා සිසුන් තෝරා ගැනීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ක්‍රමවේදයේ ස්වභාවය මෙම තත්වයට හේතු වී ඇත. | විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සිසුන්ගෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට හැකියාව ලැබෙන ශිෂ්‍ය සංඛ්‍යාව ඉතාමත් අඩු මට්ටමක් බැවින්, විශ්වවිද්‍යාල පද්ධතිය තුළම විශ්වවිද්‍යාලවලට ඇතුළත් කළ හැකි ශිෂ්‍ය ධාරිතාවය උපරිමයෙන් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 1980 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වසර 35 ක කාලය තුළ කෘෂිකර්ම තාක්ෂණ හා කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා කෘෂිකර්ම පීඨය තුළ ශිෂ්‍යයන්ගේ වැඩිවීම සියයට 17.5 මට්ටමක පැවති අතර භෞතික හා මානව සම්පත්වලට හා කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුමට සාපේක්ෂව ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | අපගේ අරමුණ වන්නේ සමාජයට බරක් නොවන ගුණත්වයෙන් වැඩි උපාධිධාරියෙක් බිහි කිරීමයි.ඒ අනුව පාඨමාලාවන් යාවත්කාලීන කිරීම සහ අපගේ stake holder අදහස් අනුව වැඩි දුරටත් ගුණත්වය වැඩි කිරීම සිදු කර ඇත. මේ වන විට පීඨයට බඳවා ගනු ලබන සංඛ්‍යාව වැඩි කර ඇති අතර පීඨයේ අඩංගු උපාධි පාඨමාලා ප්‍රමාණයද වැඩි කර ඇත. | භෞතික හා මානව සම්පත්වලට හා කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුමට සාපේක්ෂව ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

**3.4 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.49,704,134 ක් හා සමාලෝචිත වර්ෂයේ ලද රු.10,000,000 ලෙස එකතුව රු.59,704,104 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 14 ක් සඳහා ලද මුදල් උපයෝජනය කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති අතරින් 03 ක වැඩ ආරම්භ කර නොමැති අතර තවත් ව්‍යාපෘති 05 ක වැඩ ආරම්භ කර ඇතත්, සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් සිදු කර නොමැත. තවත් ව්‍යාපෘති 04 ක වැඩ නිම කර ඇති බැවින් එම ගිණුම් ශේෂවලට අදාළ ගැලපීම් කිරීමට සටහන් කර ගනිමි. | ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාළව පවතින හා ලැබෙන අරමුදල් ඒ ඒ වර්ෂවලදී උපයෝජනය කිරීමට සැලසුම් හා නිසි අධීක්ෂණය කළ යුතුය. |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 ඔක්තෝබර් 17 දින සිට 2018 පෙබරවාරි 08 දින දක්වා ඉදිකිරීම් කටයුතු අවසන් කර විශ්වවිද්‍යාලය වෙත බාරදී තිබුණු රු.875,752,824 ක් වටිනා නේවාසිකාගාර 04 ක් 2019 අප්‍රේල් මස වන විටත් ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් සඳහා ලබා දී නොතිබූ අතර 2018 දෙසැම්බර් 31 වන විට සිසුන් 5582 ක් සඳහා නේවාසික පහසුකම් ලබා දිය යුතුව තිබුණි. | ගොඩනැගිලිවල යටිතල පහසුකම් කිසිවක් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි භාරගත් දින සිට එම නේවාසිකාගාර සඳහා අවශ්‍ය මළ අපවහන පද්ධතිය සහ ආපනශාලා සකස් කිරීමටත් අවශ්‍ය ගෘහ භාණ්ඩ සැපයීමටත් අවශ්‍ය කාර්ය මණ්ඩල අනුයුක්ත කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | විශ්වවිද්‍යාලය සතු සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාලය රුපියල් මිලියන 82.2 ක වියදමින් 2012 වර්ෂයේ ආරම්භ කර 2015 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබූ කලාගාරය සඳහා රු.6,855,652 ක වැය කර ඉදිකර තිබූ ගොඩනැගිල්ල වසර 04 ක කාලයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගරා වැටෙමින් පැවතුණි. | ආදි විද්‍යාර්ථයින් භාරකාර අරමුදල් මණ්ඩලය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්මාදම් කිරීම මත 2012 වර්ෂයේ සැලසුම් කළ පරිදි ප්‍රතිපාදිත ආධාර මත ක්‍රියාත්මක කර 2014.10.24 දින නිම කර තිබුණි. නමුත් සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කර නොතිබීම මත අවසන් කාර්යය සඳහා භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පවතී. | වසර 04 කට අධික කාලයක් නිෂ්කාර්යව පවතින මෙම ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර, සැලසුම් සහිතව ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන පරිදි කටයුතු කරමින් විශ්වවිද්‍යායේ අධ්‍යයන පීඨ 04 ක් සහ විවිධ අංශ 03 ක් මගින් විවිධ සේවාවන් 12 ක් සඳහා තෝරා ගත් සැපයුම්කරුවන් සමග දිගින් දිගටම ගිවිසුම්වලට එළඹ තිබුණි. | මෙම ගැටළුකාරී තත්ත්වය පැන නැගී ඇති සියලු සේවා ස්ථාන 2019.12.31 දිනෙන් අත්හිටුවන අතර 2020 වර්ෂයේ සිට එම සියළුම සේවා ස්ථාන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව සුදුසු සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. | පවතින නිති, රීතිවලට අනුගත විය යුතුය. |

## 3.7 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලය සතු අක්කර 22 කට අධික බිම් කොටස් ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව, බෝවලවත්ත වජිරාරාම අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානය සහ දිවි නැඟුම දෙපාර්තමේන්තුව වෙත බදු පදනම මත පවරා දී ඇතත්, නිසි පරිදි බදු මුදල් අයකර ගැනීමට හෝ නැවත අදාළ බිම් කොටස්වල භුක්තිය විශ්වවිද්‍යාලය සතු කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | 1996 වර්ෂය සඳහා පමණක් ප්‍රාදේශීය සභාව වෙත බදු දී ඇති අතර අදාළ මුදල් අයවී ඇත. ඉන් පසු බදු දීමක් කර නැත.<br><br>බෝවලවත්ත වජිරාරාම අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ඉඩම 1986 වර්ෂයේදී 99 අවුරුදු බදු පදනම | විශ්වවිද්‍යාලයට නිත්‍යානුකූලව ලැබිය යුතු මුදල් කඩිනමින් අය කර ගැනීම හෝ ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | මත ලබාදී ඇති අතර වසර 10 කට ගෙවීම් සිදුකර ඇත. වසර 10 න් පසු බදු අයකිරීම සම්බන්ධව බදු ගිවිසුමේ සඳහන් කර නොමැති නමුත් ඒ පිළිබඳ ඉඩම් ගොඩනැගිලි නඩත්තු කමිටුවට යොමු කර ඇත.<br><br>දිවිනැගුම දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගිය ඉඩමේ බදු කාලය 2017.12.31 අවසන් වූ අතර ගිවිසුම් ප්‍රකාරව අදාළ ඉඩම සහ ගොඩනැගිලි පරිශ්‍රය විශ්වවිද්‍යාලය වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලෙස එම දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී. | |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති ව්‍යාපෘති කළමනාකරු සහ ව්‍යාපෘති ඉංජිනේරු විසින් 2018 වර්ෂයේදී රු.3,281,369,421 ක් වටිනා ඉදිකිරීම් ව්‍යාපෘති 22 ක් අධීක්ෂණය කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.504,549,057 ක් වටිනා සංචලන අත්තිකාරම් සහ රු.318,158,683 ක් වටිනා අන්තර් බිල්පත් (Interring Payment) මෙම කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන්ගේ සහතික කිරීම් මත ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති ඉංජිනේරු තනතුරු 03 ක් වසර 03 ක කාලසීමාවක් සඳහා පමණක් බඳවා ගැනීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලද අනුමැතිය ප්‍රකාරව වර්තමාන ව්‍යාපෘති ඉංජිනේරුවරුන් බඳවාගෙන ඇත. ඒ අනුව 2017 සැප්තැම්බර් මාසයේ සිට බඳවාගෙන ඇති ව්‍යාපෘති ඉංජිනේරුවරුන් ව්‍යාපෘති කළමනාකරු යටතේ ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ඉංජිනේරු කටයුතු සඳහා නිරීක්ෂණ සහ සහතික කිරීම සිදු කරනු ලබයි. | මෙවැනි තනතුරුවල වගකීමේ ස්වභාවය අනුව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම අවදානම් සහිත වන බැවින්, ස්ථිර පත්වීම් සඳහා බඳවා ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2018 වර්ෂය සඳහා අනුමත කාර්යය මණ්ඩලය තුළ පුරප්පාඩු වී ඇති තනතුරු 516 ක් සඳහා රු.286,295,486 ක මුදලක් ප්‍රතිපාදන | විවිධ හේතූන් මත පුරප්පාඩු වී පවතින තනතුරු පිරවීමට නොහැකි වී ඇති අතර අත්‍යාවශ්‍ය තොරතුරු සඳහා එම පුරප්පාඩු වූ තනතුරුවල | අදාළ පුරප්පාඩු කඩිනමින් පිරවීමට හෝ අහෝසි කර දැමීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සලසාගෙන තිබුණත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් අනුමත සේවක සංඛ්‍යාවෙහි තනතුරු 296 ක් පුරප්පාඩු වීම නිසා 2018 වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් සහ වේතන සඳහා අධි ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. | ප්‍රතිපාදනවලින් තාවකාලික පදනම මත විශ්වවිද්‍යාලයේ අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගැනීමට පුද්ගලයින් බඳවාගෙන ඇති බැවින් පුරප්පාඩු තනතුරු සඳහාද ප්‍රතිපාදන සලසා ගෙන ඇත. | |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 වගන්තියට පටහැනිව සහ 2018 වර්ෂයේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩ සටහන් අයවැය ලේඛනය මඟින් අනුමැතිය ලබා දී නොමැති තනතුරු 5 කට අයත් නිලධාරීන් 05 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර, ඒ වෙනුවෙන් 2018 වර්ෂයේදී වැටුප් සහ වේතන වශයෙන් රු.2,773,215 ක් ගෙවා තිබුණි | එම නිලධාරීන් බඳවා ගනු ලැබුවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ රාජකාරි කටයුතු පවත්වාගෙන යාම සඳහායි. 2011 වර්ෂයේ අයවැය යෝජනාවලට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 6 ක් ජාත්‍යන්තර මට්ටමට පත් කිරීමට ගන්නා ලද තීරණයට අදාළව ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුව එම අරමුණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් රුපියල් මිලියන 100 අරමුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත වෙන් කර තිබූ අතර ඒ සඳහා අවශ්‍ය සේවකයින්ගේ අවශ්‍යතාවය සඳහන් කරමින් ඉදිරිපත් කරන ලද යෝජනාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇත. | අදාළ චක්‍රලේඛවලට අනුගත විය යුතුය. |